# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම් අංක 09 -2020
## මව්බස

Name / Index No :........................................................ **Grade 3**

**2020.06.02 සිට 2020.06.08 දක්වා මව්බස වැඩ පැවරුම කරවන්න.**

**3 ශ්‍රේණිය සියලුම පන්ති සඳහා - දෙවන වාරය**

වැඩ පැවරුම සිදුකිරීම සඳහා උපදෙස්,

- මෙම වැඩ පැවරුමේ දිනය යොදා දිනට නියමිත වැඩ මව්බස ලිවීම පොතේ කරවන්න. පිළිවෙළින් අලවන්න.
- **හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා මව්බස පොතේ අලවන්න.**
- මෙම පැවරුමේ ඇතැම් කොටස් " සිංහල පැවරම් " ( ඡේද කපන පොත ) හි තිබේ. එම පොතෙන් එම කොටස කපා පිළිතුරු ලියා අලවන්න.
- අසා ලිවීම අදාල පොතේ සිදු කරවන්න.
- දරුවා පැවරුම සිදුකර අවසාන වූ පසු සහය වන වැඩිහිටියා විසින් වැරදි යමක් වේ නම් එය යටින් තද නිල් පැහැ පාට පැන්සලෙන් යටින් ඉරක් අඳින්න. එයට ඉදිරියෙන් දරුවා ලවාම නිවැරදි පිළිතුරු ලියවන්න.
- පාඩමට අදාළ Whatsapp මගින් Video Clips, Audio Clips එවා ඇත්නම් පෙන්වා දී පැහැදිලි කර දෙන්න.

**2020/06/02 අඟහරුවාදා දිනට**

01. පහත සඳහන් මාතෘකාවට අදාළ පින්තූරය ඇඳ, තමා එම චරිතය යැයි සිතා වාක්‍ය 5 ක් ලියන්න.

<u>අලියා</u>

1. ..........................................................................................................................................

..........................................................................................................................................

2. ..........................................................................................................................................

..........................................................................................................................................

3. ..........................................................................................................................................

..........................................................................................................................................

4. ..........................................................................................................................................

..........................................................................................................................................

5. ..........................................................................................................................................

..........................................................................................................................................

Richmond College - Grade 3 – 2020

02. ඔබ වෙත ලැබී ඇති Audio Clip එකට සවන් දෙන්න.

❖ ඊට අදාළව පහත සඳහන් ප්‍රශ්න හරි නම් හරි බවද වැරදි නම් වැරදි බවද වාචිකව ලබා ගන්න.

1. මියුලු නුවර රජකම් කළ රජතුමා වේදේහ නම් වේ. ( )
2. සිරිවඩ්ඪන සිටුතුමාගේ පුතා මහෞෂධ කුමරු වේ. ( )
3. රජතුමා අගමුල සමාන නැති කිහිරි දණ්ඩක් ගම්වැසියන්ට එව්වේ ය. ( )
4. මහෞෂධ කුමරුට කිහිරි දණ්ඩෙහි අග මුල දැන ගැනීමට නොහැකි විය.( )
5. මහෞෂධ කුමරුගේ නුවණ පිළිබඳ දැනගත් රජතුමා සතුටට පත් විය. ( )

## 2020/06/03 බදාදා දිනට

03. අග මුල සෙවූ හැටි කතාව නිශ්ශබ්දව කියවන්න. (කියවීම පොතේ 67-70 පිටුව දක්වා)




අග මුල සෙවූ හැටි

- පහත සඳහන් වචන පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. පසුව එම වචන බලා ලියන්න.

1) මහෞෂධ
2) නුවණ
3) ලණුවක්
4) ප්‍රයෝජන
5) පරීක්ෂා
6) ප්‍රශංසා
7) ගැටලු
8) ප්‍රකාශ
9) රාජනියෝගය
10) දණ්ඩ
11) දඬයක්

## 2020/06/04 බ්‍රහස්පතින්දා දිනට

- පෙර දින බලා ලියූ වචන අසා ලියන්න.

04. අසා ලියූ වචන යොදාගෙන වාක්‍ය ලියන්න.

05. සිංහල වැඩ පොතේ




62 හා 63 පිටුවල ,

- අවබෝධය

1 සිට 4 දක්වා ප්‍රශ්න පමණක් සම්පූර්ණ කරන්න.

Richmond College - Grade 3 – 2020

**2020/06/05 සිකුරාදා දිනට**

06. සිංහල කියවීම් පොතේ තේරවිලි කවි (පිටු අංක 22-23) ශබ්ද නගා කියවන්න.




- පහත සඳහන් කර ඇති තේරවිලි කවියට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

**( කොකා, ඉදල, යතුර, කරවිල, පනාව )**

1. තපස් රකිනවා
කෙතේ ඉන්නවා
මාළු සොයනවා
කියන්න මගේ නම

............................

2. දත් තිබුණත් කටක් නැතේ
සියලුම දත් උල් ව ඇතේ
අවුල් ලිහා හැඩ කරතේ
නැති ගෙදරක් ඇත්තේ නැතේ

............................

3. උඩහ ගෙදර මම යන කොට
අඟර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි
නොතේරුවොත් ටොකු විස්සයි

............................

4. පිරිසිදුකම කරන අගේ
රැවුළ ඉත්තෑ කුරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුළ ඇදෙයි පොළොව දිගේ

............................

5. ගුලක් බලා රිංගනවා
ඒක ඇතුළෙ කැරකෙනවා
ගේ දොර බඩු රැක දෙනවා
තේරුවොතින් පඩි දෙනවා

............................

Richmond College - Grade 3 - 2020

- ඔබ තනිව ම තේරවිලි කවියක් නිර්මාණය කර ලියන්න.

.............................................................................

.............................................................................

.............................................................................

.............................................................................

- තේරවිලි කවි පාඩම් කරන්න.

- සිංහල වැඩ පොතේ ,




30 පිටුව සහ 31 පිටුවල ඇති ,

1) අවබෝධය

2) ක්‍රියාකාරකම 2

3) ක්‍රියාකාරකම 3 සම්පූර්ණ කරන්න.

**2020/06/01 සඳුදා දිනට**

- පෙර පන්තිවලදී උගත් සමානාර්ථ පද දරුවාගෙන් විමසන්න.

1. ගස = රුක
2. ඉර = හිරු
3. ප්‍රවෘත්තියක් = පුවතක්
4. කැලෑව = වනය
5. දූපත = දිවයින
6. රාත්‍රිය = රැය
7. ඇස් = නෙත්

Richmond College Grade 3 – 2020

- "සිංහල පැවරුම්" හි තිබෙන සිතුලගේ රචනය කියවන්න.
  - ❖ එම රචනයේ පහත දැක්වෙන වචන පාට පැන්සල්වලින් කොටු කිරීමට පවසන්න.

ප්‍රවෘත්තියක් = පුවතක් ( පද දෙකම නිල්පාටින් )

කැලෑව = වනය ( පද දෙකම කොළපාටින් )

දූපත = දිවයින ( පද දෙකම රතුපාටින් )

රාත්‍රිය = රැය ( පද දෙකම කහපාටින් )

ඇස් = නෙත් ( පද දෙකම රෝසපාටින් ) පාටකරන්න.

  - ❖ සිතුලගේ රචනය කොටස කපා අලවන්න.

- <u>මව්බස ලිවීම පොතේ ,</u>

## <u>සමානාර්ථ පද</u>

යමක් හැඳින්වීමට පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කරන විට එම වචන සමානාර්ථ පද ලෙස හැඳින්වේ.

- මෙම පැවරුම මව්බස ලිවීම පොතේ කරන්න.
- ගැළපෙන සමානාර්ථ පදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| පුවතක් | වනය |
| රාත්‍රිය | ප්‍රවෘත්තියක් |
| දූපත | නෙත් |
| කැලෑව | දිවයින |
| ඇස් | රැය |

- එම සමානාර්ථ පද යොදා වැකි සකස් කර මව්බස ලිවීම පොතේ ලියන්න.

උදා:- ඒ <u>වනය</u> හරි ලස්සනයි.

ඒ <u>කැලෑව</u> හරි ලස්සනයි.

- සිංහල වැඩ පොතේ 64 පිටුව සම්පූර්ණ කරන්න.




Richmond College - Grade 3 – 2020